**සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**---------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 06 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 24 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යන ඉතිරි කිරීමේ ගිණුමක ශේෂය රු. 634,417 ක් ඇතුළත්කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | මෙම ශේෂය 2018 මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොමැති අතර 2019 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීම සඳහා ගිණුම සකස් කරන නිලධාරිණියට උපදෙස් දී ඇත. |
| (ii) | දෙමටබැද්ද ජල ව්‍යාපෘති තොග ගිණුමේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලෙජරය අනුව ශේෂය රු. 57,462 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සකස් කිරීමේදී එය රු. 236,493 ක් ලෙසට රු. 179,031 ක් වැඩියෙන් දක්වා තිබුණි. මෙම ගිණුම් තැබීම නිසා ගිණුම් තුලනය වූ ආකාරයද විගණනයට පැහැදිලි නොවීය. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට නිවැරදිකර ගැනීමට අදාල නිලධාරිණියට උපදෙස් දුනිමි. |
| (iii) | සමාලෝචිත වර්ෂය සඳහා පවත්වා තිබුණු පොදු ලෙජරය අනුව ජල සේවා සඳහා වූ ප්‍රාග්ධන වියදම් රු. 1,278,688 ක් වුවද මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයේ එම වටිනාකම රු. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | සටහනක් මගින් නිවැරදිකර ගැනීමට අදාල නිලධාරිණියට උපදෙස් දුනිමි. |

| | | | |
|---|---|---|---|
| | 1,163,867 ක් ලෙසට රු. 114,821 ක් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (iv) | සමාලෝචිත වර්ෂය සඳහා පවත්වා තිබුණු පොදු ලෙජරය අනුව ජල සේවා ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු වියදම රු. 108,632 ක් වුවද මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයේ එය රු. 47,422 ක් ලෙසට රු. 61,210 ක් අඩුවෙන් දක්වා තිබුණි | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | සටහනක් මගින් නිවැරදිකර ගැනීමට අදාල නිලධාරිණියට උපදෙස් දුනිමි. |
| (v) | ප්‍රාදේශීය සභාවට අයත් රු.1,100,000 ක අගයකට තක්සේරුකර තිබුණු ඉඩම් 3 ක් සහ තක්සේරු නොකරන ලද සුසාන භූමි 47ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ඇතුළත් කිරීමට අතපසු වූ තාවකාලික තක්සේරුකර ඇති ඉඩම් 03ක් සහ තක්සේරු නොකරන ලද සුසාන භූමි 47 සම්බන්ධව තාවකාලික තක්සේරු ලබා ගෙන ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට අදාල නිලධාරිණියට උපදෙස් දුනිමි. |

## (ආ) <u>නොසැඳුනු පාලන ගිණුම්</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ------------------------------------------- | ---------------- | ---------------------------------- |
| සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන කර්මාන්ත ණයගැති සහ මුද්දර ගාස්තු ශේෂයන් සහ අදාල ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු. 268,380 ක වෙනසක් පැවතුණි. | නොසැසඳීම්වලට හේතු සොයා බලා නිවැරදි කළ යුතුවේ. | අදාල වෙනස නිවැරදි කර, ලේඛන පවත්වාගෙන යාමට නිලධාරීන්ට උපදෙස් දුනිමි. |

## (ඇ) <u>විගණනය සඳහා සාක්ෂි නොවීම්</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ------------------------ | ----------- | ------------------------------ |
| රු. 5,057,253 ක් වූ පොදු තැන්පත් ශේෂයට අදාළ යාවත්කාලීන කරන ලද පොදු තැන්පත් ලේඛනය ඉදිරිපත් නොකිරීම | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | පොදු තැන්පත් ලේඛනය යාවත්කාලීන කිරීමට විෂය භාර නිලධාරිණියට උපදෙස් දුනිමි. |

**1. 4** <u>**අනුකූල නොවීම්**</u>

<u>**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**</u>

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| **(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | | |
| (i) 126(vii)(ඌ) වගන්තිය | අතුරු ව්‍යස්ථා පනවා රථවාහන නැවතුම් ස්ථානවලින් ගාස්තු අයකර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සභා බලප්‍රදේශය තුල ඇති රථ වාහන ගාල් කරන ස්ථාන හඳුනාගෙන 2019 ජූලි 31 දිනට පෙර වාර්ෂිකව ගාස්තු අය කිරීමට කටයුතු කරමි. |
| (ii) 126(vii)(ඊ) වගන්තිය | සභා බලප්‍රදේශය තුල ප්‍රදර්ශනය කර තිබුණු ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු පිළිබඳව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 ජුනි 30 දින වන විට සභා බලප්‍රදේශයේ ඉදිකොට ඇති ස්ථාවර වෙළඳ ප්‍රචාරණ දැන්වීම් පුවරු පිළිබඳ වාර්තාවක් ලබා ගෙන ඊට අදාල ගාස්තු අය කිරීමට අවශ්‍ය පියවර ගනිමි. |
| (iii) 147(i) වගන්තිය | | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝටල් ආපනශාලා හෝ නවාතැන්පොළවල් පිළිබඳව කඩිනම් සමීක්ෂණයක් සිදු කොට 2019 ජුනි 30 දිනට පෙර අදාල ගාස්තු අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ** xxiv පරිච්ඡේදයේ 4 වගන්තිය | 2004 වර්ෂයට පෙර සහ 2005 වර්ෂයේ සිට පැවත එන පිළිවෙලින් රු. 2,034 ක සහ රු. 31,255 ක සේවක ණය අයකර ගෙන නොතිබුණි. | හිඟ සේවක ණය අය කිරීමට කටයුතු කළ යුතුවේ. | හිඟ ණය ශේෂ පවතින සේවකයන් මේ වන විට මිය ගොස් ඇති බව අනාවරණය වී ඇත. ඔවුන් වෙනුවෙන් සභාවේ නඩත්තු කරන ලද ණය ලිපිගොනුද අදාල ඇප කරුවන්ද සොයාගත නොහැකි වී ඇත. එබැවින් එම හිඟ ණය අයකරගැනීමේ දී එකල සේවයේ යෙදී සිටි නිලධාරීන්ගෙන් අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) **2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය** | සභාව සතු වාහන 4ක් සම්බන්ධයෙන් ඉන්ධන දහනය පරීක්ෂාකර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතුවේ. | මෙම වාහන යන්ත්‍ර ගණයට වැටෙන අතර, මේ සඳහා ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට යාන්ත්‍රික ඉංජිනේරු වෙත යොමුකර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,571,368 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 7,577,611 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,000 | - | - | - | 2,000 | - | - | - |
| (ii) | කුලී | 15,145,147 | 9,737,317 | 9,851,573 | 38,169 | 15,332,710 | 9,668,760 | 9,685,385 | 118,775 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,613,000 | - | 1,793,370 | - | 1,563,000 | - | 1,436,630 | - |
| (iv) | වෙනත් ආදායම් | 9,394,000 | 6,054,351 | 9,562,142 | 2,616,201 | 6,675,800 | 5,628,125 | 4,956,925 | 2,829,763 |
| | එකතුව | 26,154,147 | 15,791,668 | 21,207,085 | 2,654,370 | 23,573,510 | 15,296,885 | 16,078,940 | 2,948,538 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

#### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට බිල්කරන ලද රු. 15,791,668 ක් වූ මුළු ආදායමින් වර්ෂය අවසාන වන විට රු. 2,654,370 ක් හෙවත් සියයට 17 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකරගත යුතුවේ. | සමාලෝචිත වර්ෂයට අදාල හිඟ මුදලින් කොටසක් මේ වන විට අයවී ඇති අතර හිඟ හිටි මුද්දර ගාස්තු අය කර ගැනීමට අදාල ලිපි සකස්කර 2018 ජූලි 19 දින පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට යවා ඇත. |

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකිරීමට කටයුතුකර නොතිබුණි. | දියුණු කල ප්‍රදේශ කලින් කල හඳුනාගෙන අදාළ ක්‍රියාමාර්ග අනුගමනය කර වරිපනම් අයකරගත යුතුවේ. | සභා බලප්‍රදේශය තුල වරිපනම් අයකර ගත හැකි ප්‍රදේශ වශයෙන් සියඹලාණ්ඩුව, ඇතිමලේ, දොඹගහවෙල යන උප නගර හඳුනාගෙන වරිපනම් අය කරගැනීමට අදාල මූලික කටයුතු ආරම්භ කිරීමට නිලධාරීන්ට උපදෙස් දී ඇත. |

**2.2.4** <u>වාහන කුලියට දීමේ ආදායම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් බැකෝ ලෝඩරය සහ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය කුලියට දීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු රු. 304,325 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකරගත යුතුවේ. | මේ වන විටත් හිඟ මුදල් එකතු කිරීමට කටයුතු කරන අතර, 2019 මැයි 17 දින වන විට රු.25,050ක් අයවී ඇත. |

**2.2.5** <u>ජල ගාස්තු ආදායම් අයකිරීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ජල ගාස්තු ආදායම රු.75,419 ක් විය. | හිඟ ජල ගාස්තු අයකර ගත යුතුවේ. | 2018 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ජල ගාස්තු රු.75,419කින් 2019 අප්‍රේල් 30 දින වන විට රු.63,191ක් අය වී ඇති බවත් හිඟ මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය හිඟ නිවේදන යවා ඇත. |

**2.2.6** <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවෙන් රු. | හිඟ උසාවි දඩ සහ මුද්දර ගාස්තු අයකර ගත | 2018 දෙසැම්බර් 31 දිනට අය විය යුතු රු.137,978ක උසාවි දඩ මුදලින් |

| | | |
|---|---|---|
| 137,978 ක උසාවි දඩ සහ රු. 5,351,017 ක මුද්දර ගාස්තු අයවිය යුතුව තිබුණි. | යුතුවේ. | රු.121,083 ක මුදලක් 2019 පෙබරවාරි 25 දිනැති අංක 3616 ලදුපත මගින් අයවී ඇත. හිඟ හිටි මුද්දර ගාස්තු අය කර ගැනීමට අදාල ලිපි සකස්කර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට යවා ඇත. |

**2.3 අධිභාර**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂයන් තුළ පැනවූ අධිභාර වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.220,017 ක මුදලක් අයකර ගැනීමට තිබුණි. | හිඟ අධිභාර අයකර ගත යුතුවේ. | මෙම හිඟයෙන් කොටසක් මේ වන විට අයවී ඇති අතර, ඉතිරි අධිභාර මුදල් අය කර ගැනීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබුණි. | 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කළ යුතුවේ. | 2018 වර්ෂයට ක්‍රියාකාරී සැලැස්ම නිම කර නොමැති අතර 2019 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට විෂයභාර නිලධාරින්ට උපදෙස් දී ඇත. |

**(ආ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතින්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව සභාව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව | තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු මැනීම සඳහා 2020 වර්ෂයේ සිට වාර්ෂික අයවැය ලේඛන මගින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලසුම් තුලින් අදාල දර්ශක හඳුනාගෙන අදාල නිලධාරින් දැනුවත් කර කඩිනමින් අවශ්‍ය කටයුතු |

| | | | |
|---|---|---|---|
| | | ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | සඳහා ක්‍රියාත්මක වෙමි. |

**3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | 2017 ජුනි 05 දින ප්‍රාදේශීය සභාවට භාරදී තිබුණු සියඹලාණ්ඩුව සතිපොළ පරිශ්‍රයේ කඩකාමර 10 ක් සමාලෝචිත වර්ෂය අවසාන විටද බදුදී නොතිබුණි. | කඩකාමර බදු දීමට කටයුතු කළ යුතුවේ. | මෙම කඩකාමර සඳහා ජනතාවගේ ඉල්ලීම මන්දගාමී මට්ටමක පවතින බව හඳුනාගත් අතර ඒ අනුව ලද සභා තීරණයක් මත තක්සේරු මුදලින් 10% ක් අඩු කොට අවම ලංසුවට නැවත ප්‍රසම්පාදනය කිරීමට කටයුතු යොදා ඇත. |
| (ආ) | සභාවට අයත්ව තිබුණු ඉවත් කරන ලද පැරණි කඩකාමර 42 කින් අයවිය යුතු රු. 115,850 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අයකරගෙන නොතිබුණි. | හිඟ කඩකාමර කුලී කඩිනමින් අය කර ගත යුතුවේ. | ඒ ඒ කඩකාමර හිමිකරුවන් හිඟ බදු මුදල් නොගෙව්වහොත් නෛතික ක්‍රියාමාර්ග ගන්නා බවට ලිපි මඟින් දැනුවත් කර ඇති අතර, එකී මුදල් අය කර ගැනීම සඳහා සිහිකැඳවීම් ලිපි කඩිනමින් යවමි. |
| (ඇ) | අංක 02/2015 දරන 2015 ජූලි 10 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය අනුව භාවිතයට නොගන්නා වත්කම් 2015 ඔක්තෝබර් 10 දිනට පෙර අපහරණය කළ යුතු වුවද, ප්‍රාදේශීය සභාවට අයත් 2012 වර්ෂයේ සිට ප්‍රයෝජනයට නොගන්නා ට්‍රැක්ටර් 03ක් සහ ටේලර් 03ක් සම්බන්ධයෙන් ඉහත චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතුකර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | දේපොළ වෙන්දේසි කිරීම සඳහා පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ විසින් ටෙන්ඩර්පත් කැඳවා ඇත. |
| (ඈ) | සභා බලප්‍රදේශය තුල පවත්වාගෙන යන පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර 123 ක් සඳහා අදාල කටයුතු කර පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාදී නොතිබුණි | මෙම ව්‍යාපාර පරීක්ෂා කර නියමිත ගාස්තු අයකර පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා දිය යුතුවේ. | මෙම ව්‍යාපාර වලින් බොහොමයක් මේ වන විට ක්‍රියාකාරී තත්වයේ නොමැති අතර, අනෙක් ව්‍යාපාරවලට බලපත්‍ර ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට දැනුවත් කර ඇත. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**කාර්ය මණ්ඩල පුරප්පාඩු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩල අනුව සභාවේ තනතුරු 5 කට අදාලව සේවක පුරප්පාඩු 7ක් පැවතුණි. | කාර්යමණ්ඩලයේ පුරප්පාඩු පුරවාගත යුතුවේ. | මෙම පුරප්පාඩු සම්පූර්ණ කර දෙන ලෙස පළාත්පාලන කොමසාරිස් වෙතින් ඉල්ලුම්කර ඇත. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 වාහනවල අයිතිය පවරා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව භාවිතයට ගන්නා වාහන 02ක නීත්‍යානුකූල අයිතිය සභාවට පවරාගෙන නොතිබුණි. | සභාවට අයත් වාහනවල අයිතිය පවරාගත යුතුවේ. | වාහන පවරා ගැනීම සඳහා අවශ්‍ය ලිපිලේඛන මේවන විට ඉදිරිපත් කර ඇත. |

**3.4.2 නියමිත දිනට ආදායම් බලපත්‍ර ලබා නොගැනීම නිසා දඩ මුදල් ගෙවීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් වාහන 10 කට අදාලව ආදායම් බලපත්‍ර නියමිත දිනට ලබා නොගැනීම නිසා රු. 23,155 ක දඩ මුදල් ගෙවා තිබුණි. | වගකිවයුතු නිලධාරින්ගෙන් අදාල දඩ මුදල් අයකර ගත යුතුවේ. | ප්‍රාදේශිය සභාව සඳහා නිදහස් ආදායම් බලපත්‍ර නිකුත් කර ඇත. පසුව ආදායම් බලපත්‍ර සඳහා ගාස්තු ගෙවන ලෙස ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් දැන්වූ අතර, මේ හේතුව නිසා දඩ මුදල් ගෙවීමට සිදු විය. |

**3.5 ප්‍රසම්පාදනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි. | අනුමත වාර්ෂික අයවැය ලේඛනයට අනුව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතුවේ. | 2018 වර්ෂය දක්වාම ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොමැති අතර, 2019 වර්ෂයට අදාලව සකස්කර ඇත. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු කළ ආදායම් හා වියදම්, වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 8 ක සියයට 14 සිට සියයට 110 දක්වාද වියදම් විෂයයන් 8ක සියයට 8 සිට සියයට 98 දක්වාද විචලනයන් පැවතුණි. | තාත්වික අයවැය ලේඛනයක් පිළියෙල කර එහි දක්වා ඇති ඉලක්ක සපුරාගත යුතුවේ. | ඉදිරි වර්ෂයන් වලදී මෙවන් විචලනයන් අවම වන පරිදි ආදායම් හා වියදම් සම්බන්ධයෙන් නිසි අවබෝධයෙන් යුතුව අයවැය පාලනය කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමි. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකල යුතුවේ. | 2019 වර්ෂයේ අවසාන කාර්තු 2 තුල අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා එකී කටයුතු විධිමත් කිරීමට නිලධාරීන්ට උපදෙස් දුනිමි. |

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2009 ජුනි 9 දිනැති අංක ඩීඑම්ජ්/ 2009 (01) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ පිළිබඳ චක්‍රලේඛය අනුව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | සභාව තුල විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවිය යුතුවේ. | 2019 වර්ෂයේ අවසාන කාර්තු 2 තුල විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. |